From
the People of Japan

ජපන් තානාපති කාර්යාලය

අංක 20, ග්‍රෙගරි පාර, කොළඹ 07

දුරකථන :- **+94-11-2693831-3** , ෆැක්ස් :- **+94-11-2698629**

ඊ මේල් :- **cultujpn@co.mofa.go.jp**

## පුවත්පත් නිවේදනය

**මාර්තු 7, 2014**

# සබරගමු පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂක කාර්යාලයට සහ 'සුරංගනී ස්වේච්ඡා සේවා' සංවිධානයට ජපන් රජයෙන් රුපියල් මිලියන 25 ක ආධාරයක්

සබරගමු පලාත් සෞඛ්‍ය අධ්‍යක්ෂක කාර්යාලයට සහ 'සුරංගනී ස්වේච්ඡා සේවා' සංවිධානය සඳහා ජපන් රජයේ 'බිම් මට්ටමේ මානව ආරක්ෂණය උදෙසා ආධාර ව්‍යාපෘතිය' යටතේ ඇමරිකානු ඩොලර් 195,072 (රුපියල් මිලියන 25) ප්‍රදානය කරන ලදී.

සබරගමුව පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂක කාර්යාලයේ ක්‍රියාත්මක කරනු ලබන 'රත්නපුර දිස්ත්‍රික්කයේ රෝහලක් ඉහල නැංවීමේ ව්‍යාපෘතිය' සඳහා ඇමරිකානු ඩොලර් 69,920 (දළ වශයෙන් මිලියන 9 ක්) ප්‍රදානය කල අතර, මෙම ව්‍යාපෘතිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ පදනංගල, චන්ද්‍රිකාවැව රෝහලේ බාහිර රෝගී අංශය අළුත්වැඩියා කිරීම, වෛද්‍ය නේවාසිකාගාරයක් ඉදි කිරීම හා අනෙකුත් වෛද්‍ය උපකරණ ලබාදීම මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරයි.

සබරගමුව පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂක වෛද්‍ය කපිල කන්නන්ගර මහතා පැවසුවේ "ජපන් තානාපති කාර්යාලය මගින් ලබාදෙන මෙම ආධාරය මගින් සබරගමුව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හරහා චන්ද්‍රිකාවැව රෝහලට ගුණාත්මක සේවාවක් ලබාදීමට හැකිවන බවයි. ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වාසය කරන 60,000 - 75,000 ක් පමණ ජනතාවකට ප්‍රාථමික සෞඛ්‍ය ආරක්ෂණ සේවාවක් ලබාදීමට චන්ද්‍රිකාවැව රෝහලට මෙමගින් හැකිවන බවයි".

'සුරංගනී ස්වේච්ඡා සේවා' සංවිධානය මගින් ක්‍රියාත්මක කරනු ලබන 'මොණරාගල දිස්ත්‍රික්කයේ ආබාධිත පවුල්හා ජීවනෝපායන් ඉහළ නැංවීම ව්‍යාපෘතිය' සඳහා ඇමරිකානු ඩොලර් 125, 152 (දළ වශයෙන් මිලියන 16 ක්) ලබාදෙන අතර එමගින් මොනරාගල දිස්ත්‍රික්කයේ ආබාධිත සහිත

පුද්ගලයන් සිටින පවුල් හි ජීවනෝපායන් ඉහළ නැංවීම මගින් ඔවුන්ගේ සමාජ තත්ත්වය ඉහළ නැංවීම අරමුණු කරනු ලැබේ.

සුරංගනී ස්වේච්ඡා සේවා සංවිධානයේ ජාතික නියෝජිත නලින් විපුලේන්ද්‍ර මහතා පැවසුවේ "සුරංගනී ස්වේච්ඡා සේවාවන් ආර්ථික වශයෙන් අභියෝගයකට ලක්වූ ආබාධිත ළමුන් හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන් සමඟ කටයුතු කරන අතර, මෙම ව්‍යාපෘතිය මගින් එම පවුල් වල ආර්ථික තත්ත්වය ඉහළනැංවීමට අවස්ථාව සැලසෙන බවයි".

ජපන් තානාපති 'නොබුහිතෝ හෝබෝ' මහතාත් සබරගමුව පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂක, වෛද්‍ය කපිල කන්නන්ගර මහාතාත් සුරංගනී ස්වේච්ඡා සේවා සංවිධානයේ ජාතික නියෝජිත වික්‍රමගේ නලින් විපුලේන්ද්‍ර මහතාත් අතර 2014, මාර්තු 7 වන දින තානාපති නිල නිවසේදී මෙම ආධාර ගිවිසුම අත්සන් කරනු ලබයි.


වැඩි විස්තර සඳහා කරුණාකර විමසන්න..

**ආර්ථික සහයෝගිතා අංශය, ජපන් තානාපති කාර්යාලය**

දුරකථන :- +94-11-2693831-3 , ෆැක්ස් :- +94-11-2698629

ඊ මේල් :- cultujpn@co.mofa.go.jp